# 2025-02-19 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. අධ්‍යාපන සහයෝගිතාව සඳහා කොළඹ විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය හා සාගර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම**

අධ්‍යාපන සහ ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ඒකාබද්ධව වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධාන කිරීම අරමුණු කර ගනිමින් කොළඹ විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය හා සාගර විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට සැලසුම් කර ඇත. යෝජිත අවබෝධතා ගිවිසුමේ කාර්යයන් මූලිකව කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණික ආයතනයට අදාළ වන පරිදි ක්‍රියාත්මක කිරීමට දෙපාර්ශ්වය එකඟ වී ඇත. ඒ අනුව, වසර පහක (05) කාලසීමාවක් සඳහා බලාත්මක වන පරිදි යෝජිත අවබෝධතා ගිවිසුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ විශ්වවිද්‍යාලය සහ කොරියානු ජනරජයේ ජාතික කොරියානු සමුද්‍රීය හා සාගර විශ්වවිද්‍යාලය අතර අත්සන් තැබීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

Sri lanka mirror

**02. විදේශ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාළව හංගේරියානු අපනයන ණය රක්ෂණ පුද්ගලික සමාගම සහ ශ්‍රී ලංකා රජය අතර ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳව වන ගිවිසුම**

2022 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකා රජය විසින් තෝරාගත් විදේශ රාජ්‍ය ණය සඳහා ණය සේවාකරණය අත්හිටුවීමේ අතුරු ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, රාජ්‍ය ණය තිරසරභාවය ළඟා කර ගැනීම සඳහා ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට එළඹ ඇති අතර මේ වන විට දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන සාර්ථකව නිම කර ඇත. තව ද, විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළව නිල ණය හිමියන්ගේ කමිටුව සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබේ. එකී අවබෝධතා ගිවිසුම පරිදි විනිවිදභාවය සහ සංසන්දනාත්මක බව සහතික කරමින් අනෙකුත් අදාළ රටවල් සමඟ ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වන ගිවිසුම්වලට එළඹිය යුතු වේ. ඒ අනුව, හංගේරියානු අපනයන ණය රක්ෂණ පුද්ගලික සමාගම සහ ශ්‍රී ලංකා රජය අතර ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ගිවිසුමකට අත්සන් තැබීමට සැලසුම් කර ඇත. හිඟ ණය ප්‍රතිශෝධනය මඟින් ණය සහනයක් ලබා දීමට හංගේරියානු අපනයන



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ණය රක්ෂණ පුද්ගලික සමාගම එකඟ වී ඇති අතර, එලෙස ප්‍රතිශෝධනය කරනු ලබන සියලුම ණය මෙම යෝජිත ගිවිසුම යටතේ ආවරණය වනු ඇත. යෝජිත ගිවිසුම සඳහා නීතිපති විසින් සිය නිෂ්කාශනය ලබා දී තිබේ. ඒ අනුව, හංගේරියානු අපනයන ණය රක්ෂණ පුද්ගලික සමාගම සමග ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ගිවිසුමකට එළඹීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **නියමු ව්‍යාපෘතියක් ලෙස කොරියානු ජනරජයේ සෘතුමය සේවක වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

කොරියානු රජය තම කෘෂිකර්මාන්ත සහ ධීවර ක්ෂේත්‍රවල සෘතුමය ශ්‍රම හිඟය පියවා ගැනීම සඳහා E-8 වීසා කාණ්ඩය යටතේ සෘතුමය සේවක වැඩසටහන හඳුන්වා දී ඇත. එමඟින්, එරට පළාත් පාලන ආයතනවලට කෙටි කාලයක් සඳහා විදේශීය සේවකයින් නීත්‍යානුකූලව බඳවාගැනීමට ඉඩ සලසා දී තිබේ. එම වැඩසටහන් යටතේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා අවස්ථාව සලසා දීමට හැකි වන පරිදි දෙපාර්ශ්වය අතර සහයෝගිතාව ඇති කර ගැනීම පිණිස කොරියානු ජනරජයේ පළාත් සහ නගර සභා (ප්‍රාන්ත) විසින් කැමැත්ත පළ කර ඇත. ඒ අනුව, සුදුසුකම් ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට එකී වැඩසටහන යටතේ උපරිම වශයෙන් වසර තුනක (03) කාලසීමාවක් තුළ වාර තුනක් (03) දක්වා සේවය කිරීමට හැකි වන පරිදි නියමු ව්‍යාපෘතියක් එකාබද්ධව ක්‍රියාත්මක කිරීම සඳහා කොරියානු ජනරජයේ අදාළ පළාත් සහ නගර සභා (ප්‍රාන්ත) සමඟ අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීමටත්, නියමු ව්‍යාපෘතියෙහි සාර්ථකත්වය මත පදනම්ව එම වැඩසටහන ඉදිරියට පවත්වාගෙන යාමටත් විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

Sri lanka mirror

04. **ජාතික ඵලදායිතා සම්මාන කරගාවලිය**

ශ්‍රී ලංකාව 1966 වර්ෂයේදී ආසියානු ඵලදායිතා සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් අනතුරුව ජාතික ඵලදායිතා සංවිධානය ස්ථාපිත කර ඇති අතර, එහි කාර්යයන් වඩාත් පුළුල් කිරීම සඳහා 1994 වසරේ දී ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ස්ථාපිත කර තිබේ. තත්ත්වය, ඵලදායිතාව හා සේවාව වැඩිදියුණු කිරීම සඳහා වන යහපත් පරිචයන් අනුගමනය කිරීම සඳහා ආයතන දිරිමත් කිරීම, ජාතික දැක්ම හා සංවර්ධන වැඩසටහනට අනුගත වෙමින් පුරවැසියන්ගේ ජීවන මට්ටමට උසස් කරලීමට රාජ්‍ය ආයතන යොමු කිරීම, ආදර්ශවත් ආයතන හඳුනාගැනීම හා ජාතික මට්ටමින් ඇගයීමට ලක් කිරීම සහ සම්පත් අරපිරිමැස්ම

තුළින් තිරසර සංවර්ධනය සඳහා අනාගත ගෝලීය අභියෝගයන්ට මුහුණ දීමට රාජ්‍ය ආයතන සූදානම් කිරීම ආදී අරමුණු සහිතව 2003 වර්ෂයේදී ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. 2006 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අවස්ථා 10කදී එම තරගාවලිය පවත්වා ඇති අතර, 2020 වර්ෂයෙන් අනතුරුව එම තරගාවලිය පවත්වා නොමැත. වත්මන් රජයේ 'Clean Sri Lanka' ජාතික ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ උපායමාර්ගික මෙවලමක් ලෙස 2025/26 වර්ෂයේ සිට ජාතික ඵලදායිතා සම්මාන තරගාවලිය පාසල්, රාජ්‍ය, නිෂ්පාදන හා සේවා යන ප්‍රධාන ක්ෂේත්‍රයන් යටතේ පැවැත්වීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. හිංසනයෙහි වින්දිතයින් බවට පත් වන කාන්තාවන් සඳහා ආරක්ෂාව සැලසීම සඳහා වූ තාවකාලික රැකවරණ නිවාස පරිපාලනය**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හමුවේ හිංසනයෙහි වින්දිතයින් බවට පත් වන කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් තාවකාලික රැකවරණය සැලසීම රජය විසින් ඉටු කළ යුතු කාර්යභාරයක් ලෙස සලකනු ලබයි. ඒ අනුව, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික්ක 10ක රැකවරණ නිවාස පවත්වාගෙන යනු ලබන අතර, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධව එම නිවාසවල වියදම් දරනු ලබයි. 2025 වර්ෂයේ ජනවාරි මාසයේ සිට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ද නව රැකවරණ නිවාසයක් ස්ථාපිත කර තිබේ. එකී තාවකාලික කාන්තා රැකවරණ නිවාසය ද කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ ඒකාබද්ධව පවත්වාගෙන යනු ලබන රැකවරණ නිවාස ජාලයට ඇතුළත් කර ගැනීම පිණිස කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

Sri lanka mirror

**06. ත්‍රිකුණාමලයේ සාම්පූර්හි මෙගාවොට් 50ක (අදියර I) සහ මෙගාවොට් 70ක (අදියර II) සූර්ය බලාගාර ස්ථාපිත කිරීම**

රජයන් දෙකක් අතර සිදු කරනු ලබන ව්‍යාපෘතියක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සහ ඉන්දියාවේ ජාතික තාප විදුලි සංස්ථාවේ හවුල් ව්‍යාපාර සමාගම විසින් ඉදිකිරීම, අයිතිය දැරීම සහ ක්‍රියාත්මක කිරීමේ පදනම මත ත්‍රිකුණාමලයේ සාම්පූර්හි මෙගාවොට් 50ක (අදියර I) සහ මෙගාවොට් 70ක (අදියර II) සූර්ය බලාගාර ස්ථාපිත කිරීම පිණිස ශ්‍රී ලංකා රජය සහ ඉන්දීය රජය අතර එකඟතාවකට පැමිණ ඇත. ත්‍රිකුණාමලයේ සාම්පූර්හි ඉදිකිරීමට සැලසුම් කර තිබූ ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය

සහ ඉන්දියාවේ ජාතික තාප විදුලි සංස්ථාව විසින් හවුල් ව්‍යාපාර සමාගමක් ලෙස ස්ථාපිත කරන ලද Trincomalee Power Company Ltd මඟින් යෝජිත මෙගාවොට් 50ක සූර්ය බලාගාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබේ. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගැනීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. ආසියානු හා ශාන්තිකර කලාපයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානයේ (CIRDAP) සාමාජිකත්වය අලුත් කිරීම**

ආසියානු හා පැසිපික් කලාපයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ මධ්‍යස්ථානය (CIRDAP) කලාපීය, අන්තර් රාජ්‍ය සහ ස්වාධීන සංවිධානයක් ලෙස ආසියානු හා පැසිපික් කලාපයේ රටවල සහ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූලිකත්වයෙන් එක්සත් ජාතීන්ගේ ආයතන කිහිපයක සහ පරිත්‍යාගශීලීන්ගේ සහාය ඇතිව ස්ථාපිත කර ඇත. මේ වන විට කලාපීය රටවල් 15ක් එහි සාමාජිකත්වය දරනු ලබයි. ශ්‍රී ලංකාව 1980 වර්ෂයේදී එහි සාමාජිකත්වය ලබාගෙන ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කර තිබේ. එකී ආයතනය සඳහා වාර්ෂික දායක මුදල් ලෙස ඇමෙරිකානු ඩොලර් 17,122.00 ගෙවිය යුතු වුවද එවකට රට තුළ පැවැති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් 2022 වර්ෂයේ සිට අදාළ සාමාජික මුදල් ගෙවා නොමැත. එම මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වශයෙන් තවදුරටත් කටයුතු කිරීමට හැකි වන පරිදි 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වන සාමාජික මුදල් ගෙවීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

Srilanka mirror

**08. ගාල්ල නගරයේ ජල සම්පාදන යෝජනා ක්‍රමයෙහි ආදායම් නොලබන ජල පරිභෝජනය අඩු කිරීම සහ කළමනාකරණය කිරීම පිණිස පුද්ගලික අංශයේ සහභාගිත්වයෙන් නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම**

ගාල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය මඟින් දැනට ජල පාරිභෝගිකයින් 28,000කට පමණ සේවාව ලබා දෙන අතර, ප්‍රමාණවත් ජල සැපයුමක් නොමැති වීම හේතුවෙන් නව සැපයුම් ලබා දීම අත්හිටුවා ඇත. නව ජල සැපයුම් ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් 5,400ක් පමණ මේ වන විට පොරොත්තු ලේඛනගතව සිටී. එම අවශ්‍යතාව සපුරාලීම සඳහා අලුතින් ජල සම්පාදන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම පිණිස රුපියල් බිලියන 40.5ක පමණ අරමුදල් සලසා ගැනීමට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට හෝ රජයට මේ අවස්ථාවේදී හැකියාවක් නොමැත. එබැවින්, දැනට 45%ක

මට්ටමේ පවතින ආදායම් නොලබන ජල පාරිභෝජන මට්ටම 15%ක් දක්වා අඩු කරගෙන, ඒ අනුව ඉතිරි වන ජලය පොරොත්තු ලේඛනයේ සිටින අයදුම්කරුවන්ට ලබා දීමට හැකි වන පරිදි පුද්ගලික අංශයේ සහභාගිත්වය යටතේ කාර්යසාධනය පදනම් කර ගත් කොන්ත්‍රාත්තුවක් හරහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යෝජනා කර ඇත. යෝජිත නියමු ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය උපදේශක සේවාව සලසා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟතාව පළ කර ඇති අතර, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 1.28ක ප්‍රදානයක් ලබා දීමට ද කැමැත්ත ප්‍රකාශ කර තිබේ. ඒ අනුව, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

පොදු මහජනතාවගේ යහපත සඳහා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල වෙළෙඳපොළ මිල ස්ථාවරව පවත්වාගෙන යාමේ සහ දේශීය ගොවීන් සඳහා පහසුකම් සැලසීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහාත්, රාමසාන් උත්සවය වෙනුවෙන් පරිත්‍යාග වශයෙන් මෙරටට ලැබෙන රටඉඳි සඳහා බදු සහනයක් ලබා දීම සඳහාත් 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබ ඇති පහත සඳහන් නියමයන් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* 2024-12-31 දිනැති අංක 2417/20 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2වැනි සහ 5වැනි වගන්ති යටතේ පනවන ලද නියමය.

* 2025-01-27 දිනැති අංක 2421/03 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 5වැනි වගන්තිය යටතේ පනවන ලද නියමය.

Sri lanka mirror

10. **1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ විධිවිධාන යටතේ පහත සඳහන් අති විශේෂ ගැසට් පත්‍ර මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති මෝටර් වාහන ආනයනය සඳහා පනවා තිබූ තාවකාලික අත්හිටුවීම අදියරගතව ඉවත් කිරීම සම්බන්ධයෙන් වන රෙගුලාසි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* 2025-01-27 දිනැති අංක 2421/04 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි.

* 2025-01-31 දිනැති අංක 2421/44 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි.

Sri lanka mirror

11. **1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම**

ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ හඳුනාගෙන ඇති ප්‍රායෝගික ගැටලු කිහිපයකට අදාළව විසඳුම් ලබා දීම සඳහාත්, දැනට නියාමනය නොවන ප්‍රවාහන ක්ෂේත්‍ර කිහිපයක් නියාමනය කිරීම සඳහාත් 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ විධිවිධාන කිහිපයක් වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි යාවත්කාලීන කරමින් සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති සංශෝධිත පනත් කෙටුම්පත විධිමත් ක්‍රමවේදය අනුගමනය කරමින් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබූ නමුත් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුවෙන් ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට හැකි වී නොමැත. එකී පනත් කෙටුම්පත නැවත රජයේ ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවනු ලැබ ඇති නියෝගය**

2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත මඟින් විමර්ශන පැවැත්වීම පහසු කිරීම සඳහා වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් රඳවා තබා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා ද, ඇතැම් නඩුවලදී ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම බැහැර කිරීම සඳහා ද, පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ දිවුරුම් සාක්ෂි ලබා ගැනීම සඳහා ද, ඊට සම්බන්ධ කාරණා සඳහා ද විධිවිධාන සලසා ඇත. එකී පනතේ විධිවිධාන, පනත ක්‍රියාත්මක වූ දින සිට වසර 02ක කාලයක් සඳහා වලංගු වේ. එම පනතේ 7 වන වගන්තියේ (2) වන උපවගන්තියට අනුව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් පනත ක්‍රියාත්මක වීම තවදුරටත් දීර්ඝ කරනු ලැබිය හැක. ඒ අනුව, එකී පනත ක්‍රියාත්මක වීම මේ දක්වා වරින්වර දීර්ඝ කරනු ලැබ තිබේ. අදාළ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීම 2025-02-02 දින සිට තවත් වසර 02ක කාලයකින් දීර්ඝ කරමින් අංක 2418/28 හා 2025-01-08 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයේ පළ කරනු ලැබ ඇති නියමය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **ත්‍රස්තවාදය මැඩපැවැත්වීම සඳහා පුළුල් නීතියක් හඳුන්වා දීම**

Sri lanka mirror

ජාතික ආරක්ෂාව සහ මහජන සාමය සම්බන්ධයෙන් එවකට පැවති තර්ජනයන්ට මුහුණ දීම සඳහා 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත පනවනු ලැබ ඇත. පසුකාලීනව 2022 අංක 12 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත වශයෙන් එම නීතියට සංශෝධන හඳුන්වා දෙමින් ජාතික ආරක්ෂාව පිළිබඳ පුළුල් නීතියක් ප්‍රකාශ කිරීම සඳහා වන අන්තර්කාලීන පියවරක් අනුගමනය කර තිබේ. ඉන් අනතුරුව, ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳව පනත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, එකී පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් කර ඇත. ඒ අනුව, එකී පනත් කෙටුම්පත සඳහා තවදුරටත් සිදු කළ යුතු සංශෝධන හඳුනාගෙන එකී සංශෝධන ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධිත පනත් කෙටුම්පතක් සකස් කරනු ලැබ ඇත. නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති අවසන් කෙටුම්පත පිළිබඳව තවදුරටත් කරුණු අධ්‍යයනය කර එකී පනත් කෙටුම්පත තවදුරටත් වැඩිදියුණු කිරීම පිණිස සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ජනාධිපති නීතිඥ රියන්සි අර්සකුලරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීම පිණිස අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පත් කරන ලද කමිටුවේ නිර්දේශ**

රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද නිලධාරි කමිටුවේ දෙවන වාර්තාව ඉදිරිපත් කර ඇත. එම වාර්තාව මගින් අමාත්‍යාංශ 11ක් යටතේ පවතින ආයතනවල සහ පළාත් සභා 05ක පවතින පුරප්පාඩු 4,987ක් අතුරින් පුරප්පාඩු 2,003ක් සඳහා බඳවාගැනීම් සිදු කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**15. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම**

2024-12-09 දිනැති සහ 2025-02-03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මගින් පිළිවෙලින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම පිණිස පනත් කෙටුම්පත් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, අදාළ සංශෝධන ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක විසින් එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සකස් කරනු ලැබ තිබේ. එම පනත් කෙටුම්පත් සඳහා නීතිපතිගේ නිෂ්කාශනයන් ලැබී ඇත. එකී පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*********

Sri lanka mirror